**සී/ස ලංකා සිමෙන්ති ලිමිටඩ් - 2017**

-----------------------------------------------------------------

සී/ස ලංකා සිමෙන්ති පීඑල්සී සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-----------------------------------------------------------------

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 අඛණ්ඩ පැවැත්ම

----------------------

සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය ප්‍රකාරව, සමාගමේ ප්‍රධාන අරමුණ වූ සිමෙන්ති නිෂ්පාදනය, සිමෙන්ති ආනයනය, විකිණීම හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීම ඇතුලුව අරමුණු 33 ක් දක්වා තිබුණි. එහෙත්, පසුගිය යුධමය වාතාවරණය තුල කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව මුළුමනින්ම විනාශ වී තිබූ අතර සමාගමේ කාර්යභාරය සිමෙන්ති ආනයනය කර විකිණීමට පමණක් සීමා වී තිබුණි.

පවතින තත්ත්වය තුළ 2016 වර්ෂයේදී රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගතකරනය යටතේ සේවකයන් වන්දි ගෙවා ඉවත් කර තිබූ අතර මෙම වාර්තාවේ දින වන විට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් එක් නිලධාරියෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. කෙසේ වුවද, 2017 මාර්තු සිට සිමෙන්ති ආනයනය කිරීමද අතහැර දමා තිබුණු අතර සිමෙන්ති කර්මාන්ත ශාලාව පිහිටි ඉඩමේ බදු කාලයද 2012 වර්ෂයේදී අවසන් වී තිබුණි.

තවද, සමාගම 1984 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම (2008 හැර) අඛණ්ඩව වසර 32 ක් එකතුව රු.15,322,215,025 ක අලාභ ලබා තිබූ අතර 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් රු.628,478,493 ක හා රු.634,157,397 ක ඍණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් ඇති වී තිබුණි.

කෙසේ වුවද, ඉහත තත්ත්වය සමාගමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2 මූල්‍ය ප්‍රකාශන

------------------

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගමේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ සමාගමේ ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර ගණකාධිකාරිවරයෙකුගේ සහාය ලබා නොගැනීම ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය කෙරෙහි සෘජු ලෙස බලපා තිබුණි.

## 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

සමාගම විසින් අවසන්වරට පිළියෙල කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
| --- | --- |
| | රු. |
| ජංගම නොවන වත්කම් | 230,229,406 |
| ජංගම වත්කම් | 45,021,489 |
| **මුළු වත්කම්** | **275,250,895** |
| **බැරකම්** | |
| ජංගම බැරකම් | 76,192,007 |
| ජංගම නොවන බැරකම් | 833,216,284 |
| **මුළු බැරකම්** | **909,408,291** |
| ශුද්ධ ප්‍රාග්ධනය හා සංචිත ඌනතාවය | (634,157,396) |
| මුළු ආදායම | 36,019,576 |
| මුළු වියදම | 41,698,481 |
| **වර්ෂයේ ඌනතාවය** | **(5,678,905)** |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2015 වර්ෂයට පෙර සිට ගෙවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බදු, ආර්ථික සේවා ගාස්තු බදු, ගෙවිය යුතු ආදායම් බදු ලෙස එකතුව රු.8,831,890 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තියේ (ඒ) සහ (බී) | ගිණුම් වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු වුවත්, 2017 වර්ෂය සඳහා මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 | රේඛීය අමාත්‍යාංශය විසින් සමාගමේ සභාපතිවරයා වෙත ලබාදී තිබූ මෝටර් රථ 02 ක් හදිසි අනතුරු වලට භාජනය වී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියා කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද එම සැලැස්ම සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ප්‍රතිව්‍යුහගතකරණ උපදෙස් වලට අනුකූලව පිළියල කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, 5.1.2 වගන්තිය ප්‍රකාරව, ආයතනය සතු වර්තමාන සම්පත්, කළමනාකරණ දක්ෂතා හා තාක්ෂණික දැනුම, සංවිධාන ව්‍යුහය, පසුගිය වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල, කාර්ය සාධනය යන ප්‍රධාන කරුණු ඊට ඇතුළත් කර නොතිබුණි. |
| (ඈ) කොළඹ කොටස් හුවමාරුවේ ලේඛනගත නීති මාලාවේ 7.4 (සී) වගන්තිය | සමාගම විසින් 2014 සැප්තැම්බර් සිට 2016 සැප්තැම්බර් දක්වා වූ නිරවද්‍ය අන්තර් මූල්‍ය ප්‍රකාශන කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් නොකිරීම නිසා සමාගමේ සුරැකුම්පත් වෙළඳපොල ගනුදෙනු අත්හිටුවා තිබුණි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු.2,369,264,877 ක් වූ අතර, එදිනට සමාගමේ ශුද්ධ වත්කම් රු.634,157,396 ක සෘණ අගයක් ගෙන තිබුණි.ඒ අනුව 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වන වගන්තිය ප්‍රකාරව දින 20 ක් ඇතුළත කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහ සභා රැස්වීමක් කැඳවා ඉහත කරුණ පිළිබඳව දැනුවත් කළ යුතු වුවත්, මෙම වාර්තාවේ දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 ඔක්තෝබර් 20 දිනැති අංක පීර්/ආර්ඊඑස්/වීආර්එස් - 1 – 2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව "සමාගමේ ඇති සිමෙන්ති සංස්ථාව සතු සියයට 62.45 ක කොටස් සහ රජය සතු සියයට 12.82 ක කොටස්, කොටස් වෙළඳපොලේ විකුණා රජයට ආදායම් ලබා දීමට" සහ මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා ලබාදුන් මුදල් ආපසු ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්ත ශාලාව හා එම වත්කම්වල වටිනාකම ලෙස රු.229,957,152 ක් දක්වා තිබූ නමුත් වසර ගණනාවකට පෙර එම වත්කම් විනාශ වී තිබූ අතර ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය හඳුනාගැනීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව, සැලසුම් කර තිබූ සිමෙන්ති කම්හලක් පිහිටුවීමේ මූලික කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.450,400 ක් වැය කර තිබුණි. එහෙත් සමාගමේ වර්තමාන මූල්‍ය දුෂ්කරතා සහ ස්වේච්ඡා වන්දි ගෙවීම්කර සේවකයින් ඉවත් කිරීමෙන් පසුව මහා භාණ්ඩාගාරය විසින් සමාගමට දී තිබූ උපදෙස් ප්‍රකාරව මෙම යෝජනා ක්‍රියාත්මක කළ නොහැකි වී තිබූ අතර, දරන ලද එම වියදම් නිශ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ නැව් පමා කුළී ලෙස එකතුව රු.1,328,526 ක් ගෙවා තිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය හා මූල්‍ය පාලනය | විධිමත් මූල්‍ය පාලන ක්‍රම හඳුන්වා නොදීම, බදු සහ ණය වැනි අත්‍යාවශ්‍ය ගෙවීම් සිදු නොකිරීම, බැංකු සැසඳුම් නිවැරදිව හා යාවත්කාලීනව පිළියෙල කර නොතිබීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම, සමීක්ෂණ මණ්ඩල පත් කර වත්කම් සමීක්ෂණය නොකිරීම සහ කර්මාන්තශාලාව ඇතුලුව වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම. |
| (ඇ) ණයගැති හා ණයහිමි පාලනය | අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට පියවර නොගැනීම සහ ඒ පිළිබඳ වාර්තා ක්‍රමානුකූලව සහ විස්තරාත්මකව පවත්වා නොගැනීම. |